# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1960/68 - 2016 අප්‍රේල් මස 01 වැනි සිකුරාදා - 2016.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ කාර්යයන් ගරු වාරිමාර්ග සහ ජලසම්පත් කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමාට පැවරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල හා කාර්යයන්ගෙන් පහත දක්වා ඇති නිශ්චිත කාර්යයන් ඉටු කිරීමේ වගකීම් හා බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(5) වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය වසන්ත නරේෂ් පරාක්‍රම සේනානායක මැතිතුමා වෙත පවරනු ලබන බවත්, එසේම මෙම අමාත්‍යාංශයේ විෂය පථයට ගැනෙන සියළු කාර්යයන් සම්බන්ධයෙන් සොයා බැලීමේ, මැදිහත් වීමේ හා සම්බන්ධීකරණය කිරීමේ අවස්ථාව තවදුරටත් රාජ්‍ය අමාත්‍යවරයාට ඇති බවත් ශ්‍රී ලාංකීය ජනතාවගේ දැන ගැනීම පිණිස ප්‍රකාශයට පත් කරමි.

1) පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ වාරි කළමනාකරණ අංශය විසින් ක්‍රියාත්මක සියළු ව්‍යාපෘති හා ආයතනික සංවර්ධන වැඩසටහන්
2) පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති හා ඉදිරියේ ක්‍රියාක්මක කිරීමට යෝජිත සියළු ව්‍යාපෘතීන් වල කටයුතු
3) පහළ මල්වතුඔය ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
4) කවුඩුල්ල වම් ඉවුර ඇළ දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

ගාමිණී විජිත් විජයමුණි සොයිසා,
වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍ය.

2016 අප්‍රේල් මස 01 වැනි දින,
වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය,
අංක 11, ජාවත්ත පාර,
කොළඹ 05.

04-724


1A - G 23252— 358 (2016/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*